''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 3051-4924
https://journals.sjp.ac.lk/index.php/pumithiri
වෙළුම: 2; II කලාපය; 2025 නොවැම්බර්; පිටු: 3-12

# ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගම්මානවල දරු නැළවිලි ගීවලින් හෙළිවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව අධ්‍යයනයක්
## (මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල සූරිය ආර ගම්මානය ඇසුරින්)

**කේ. සී. සී. තිලකරත්න**
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
chandunichethana@gmail.com

**සංක්ෂේපය**
ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගම්මානවල දරුවන් නැළවීම සඳහා මව්වරුන් විසින් භාවිත කරනු ලැබූ මුඛ පරම්පරානුගතව පැවතුණු නැළවිලි ගී වර්තමානයේ පවා භාවිත වේ. දරුවන් නැළවීමේදී භාවිත කරන ලද මෙම ගීතවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව භාවිත දැකිය හැකිය. මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබූ අධ්‍යයන ගැටලුව වූයේ දරු නැළවිලි ගීවලින් හෙළිවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය කුමක්ද? යන්නයි. අධ්‍යයන අරමුණ වූයේ දරු නැළවිලි ගීතවලින් හෙළිවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවබෝධය ලබා ගැනීම වේ. සමාජය තුළ පිරිමි දරුවා ඉපදුනු මොහොතේ සිට පවතින ආකල්ප ද ගැහැණු දරුවන් පිළිබඳව පවතින ආකල්ප පිළිබඳ ඉතිහාසය ද මෙම නැළවිලි ගීතවල අඩංගු ඇතැම් තොරතුරු හරහා හඳුනාගත හැකි විය. මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබූ අධ්‍යයන ක්‍රමවේදය වූයේ ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය හා පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදයයි.ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙම පර්යේෂණය සිදුවිය. පර්යේෂණයේ වැදගත්කම වශයෙන් ග්‍රාමීය සමාජය ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව දරුවන් පිළිබඳව හෙලා ඇති දෘෂ්ටිය හඳුනා ගැනීමට හැකි විය. එමෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳව ඔවුන්ගේ ලැදියාවන් හා ආකල්ප ද මෙහිදී හඳුනාගත හැකිය. දරුවන්ට මුළුමහත් සමාජය ආදරය කළ ද දරුවන්ගෙන් එකිනෙකට වෙනස් ප්‍රතිඵල ස්ත්‍රී හා පුරුෂ පාර්ශව වලින් බලාපොරොත්තු වන බව මෙම ගීත වලින් පිළිබිඹු වේ. ඇතැම් ගීතවල දී තම පුතාගේ දක්ෂකම් පිළිබඳව මව්වරුන් සතුටු වන ආකාරයත් තම පුතා පවුලේ සුභසාධනය සඳහා කැපවන බවත් පිරිමි පාර්ශවය තුළින් අපේක්ෂා කර තිබේ. නමුත් ගැහැනු දරුවන් සම්බන්ධයෙන් ස්ත්‍රීන්ගෙ ලද බොළඳ භාවය ,ඔවුන්ගේ අහිංසක භාවය, ඔවුන් අනාගතයේදී මව්වරුන් වන බවට අදාළ ආකල්ප සහිත තොරතුරු ඇතුළත්වන බව හඳුනාගත හැකිය. ඇතැම් නැළවිලි ගීත මඟින් ස්ත්‍රී පුරුෂ පාර්ශව දෙකටම උපදෙස් ලබාදී ඇති ආකාරය පැහැදිලි වේ.ගැහැණු දරුවා අනාගතයේ දී වයසින් වැඩෙත්ම ඇය විසින් තමන්ගේ ගරුත්වය ආරක්ෂා කළ යුතු බවත් එය ඇය සතු වගකීමක් බවත් සිය දියණියගේ මනසට කා වැද්දවීමට කටයුතු කර ඇති ආකාරයක් පෙනේ. එමෙන්ම පිරිමි දරුවන්ට ද යහපත් ගතිගුණවලින් යුතු,දෙමව්පියන්ට කීකරු දරුවකු වන ලෙසටත් සමවයස් යහළුවන් සමඟ මිත්‍රශීලී ලෙස කටයුතු කළ යුතු බවත් ඉතාමත් සෙනෙහසින් යුතුව සිය දරුවාට පවසමින් කුඩා වියේ සිටම උපදෙස් ලබාදීමට ග්‍රාමීය කාන්තාවන් දරු නැළවිලි ගීත භාවිත කර ඇති බව පැහැදිලි විය. ඒ අනුව මෙම දරු නැළවිලි ගීතවල පවා ස්ත්‍රී පුරුෂ සමාජභාවයහි වෙනසත් කාන්තාවන් හා පුරුෂයන්ට ස්ත්‍රී පුරුෂ සමාජ භාවය තුළ එකිනෙකට වෙනස් භූමිකා ලැබී ඇති ආකාරය පිළිබඳවත් හඳුනා ගැනීමට හැකි විය.

**මුඛ්‍ය පද:** කාන්තාවන්, දරුවන්, දරු නැළවිලි ගී, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, සාම්ප්‍රදායික

### හැඳින්වීම
"වාක්‍යයං රසාත්මකම් කාව්‍යයම්" කවිය යනු රසවත් වැකියක් බවට හරතමුණි නම් පඬිවරයා විසින් ප්‍රකාශ කර ඇත.කවිය තුළ රස වින්දනාත්මක හැකියාව ඇත. දරු නැළවිලි ගීත ද එසේ අසා රසවිඳිය හැකි ගීත විශේෂයකි. ශ්‍රී ලංකාවේ අතීත ජන සමාජ විඥ්ඥාණය මැනිය හැකි ඉතා ම වැදගත් සාධකයක් වශයෙන් දරු නැළවිලි ගීත හැඳින්විය හැකිය. සමාජයක දරුවන් සැලකෙන්නේ ආදරය හිමි විය යුතු පිරිසක් වශයෙනි. දරුවන්ට ඇති ආදරය ප්‍රකාශ කිරීමේ වදන් ඇතුළත් වැදගත් ජන සාහිත්‍යාංගයක් වශයෙන් දරු නැළවිලි ගීත හඳුනා ගත හැකි වේ. දරුවන් නැළවීම යන වචනාර්ථයම සකස් වී තිබෙන්නේ දරුවන් සතුටින් තැබීම, සැනසීම, දරුවන්ට යහපත් ආකල්ප ලබාදීම යන අදහස් කැටි කොට ගෙනය. මෙහි මතුපිට අදහස

වන්නේ සිටින හෝ අඬන දරුවකු සැනසීම සඳහා, පිනවීම සඳහා භාවිත කරන ගීත විශේෂයක් වශයෙනි. නමුත් මෙම කවි විචාරාත්මකව විමසා බලන විට ඒ තුළින් දරුවන්ට වීරත්වයෙන් යුතුව සැලකීම, අනාගතයේදී දරුවන්ගෙන් බලාපොරොත්තු වන අපේක්ෂාවන්, දරුවන්ගේ ගතිගුණ සකස් විය යුතු ආකාරය සහ සමාජය තුළ පවතින ප්‍රතිමාන මනාව විදහා දක්වනු ලැබේ. දරු නැළවිලි ගීත සංස්කෘතික වශයෙන් අස්පර්ශනීය උරුමයක් ලෙස සැලකිය හැකිය. නමුත් කාලයාගේ ඇවෑමෙන් බොහෝවිට මව්වරු අතින් නැළවුණු දරුවන්ගේ පරම්පරාවේ බොහෝ දරුවන්ට මෙම දරු නැළවිලි ගීත භාවිත කිරීමක් දැකිය නොහැකිය. සාමාන්‍යයෙන් දරුවන් හැඬීමේදී ද රිද්මයක් පවතී. කුඩා දරුවන් හඬන ශෛලියට පිළිතුරු සැපයීමේ රිද්මයකට නිර්මාණය වී ඇති ළයාන්විතව ගලා යන ගීතයක් වශයෙන් දරුනැළවිලි ගීත නිර්මාණය වී පවතී. මෙම සමහර ගීත සමාජයෙන් වියැකී යමින් පවතින බැවින් මේ පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් වේ. මෙම දරු නැළවිලි ගීත මගින් දරුවාගේ සංජානන හැකියාව වර්ධනය වනු ලැබේ. දරු නැළවිලි ගීතවල ගැහැණු පිරිමි පිළිබඳව ඇති විවිධ දෘෂ්ටින් අනුව සමාජය පිළිබඳව විවිධ තොරතුරු ඒ තුළින් හඳුනාගත හැකි ය.ස්ත්‍රී පුරුෂ සමාජභාවීය භූමිකා සංවර්ධනය වීමේදී ස්ත්‍රී පුරුෂ භාවය අනුව එකී භූමිකා ස්ත්‍රී හා පුරුෂ වශයෙන් එකිනෙකට වෙනස් අයුරින් ගොඩනැගීම දක්නට ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගම්මානවල දරු නැළවිලි ගීත මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව හෙලා ඇති දෘෂ්ටීන් පිළිබඳවත් ඒ ඔස්සේ ස්ත්‍රී පුරුෂ පාර්ශවවලට හිමි වූ තත්වය හා වගකීම් පිළිබඳවත් මෙම අධ්‍යයනය ඔස්සේ කරුණු සාකච්ඡා කරනු ලැබේ.

## අධ්‍යයන ගැටලුව

දරු නැළවිලි ගීත අධ්‍යයනය කිරීම මගින් පැරණි මානව අත්දැකීම් විශාල ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට හැකියාවන් නූතනයේ වුවද පවතී. දරු නැළවිලි ගීතවලින් නැළවෙන දරුවා එහි ශබ්ද රසය රසවිඳීමක් ලබා ගැනීම පමණක් සිදුකරන අතර එකී නැළවිලි ගීතවල අර්ථ රසය ඔවුන්ට නොවැටහේ. නමුත් මව විසින් එම ගායනා කරනු ලබන නැළවිලි ගීතයක් නිවසේ සිටින අනෙකුත් සාමාජිකයන්ට ශ්‍රවණය වීම සිදුවේ. මෙම දරුනැළවිලි ගීත තුළින් සමාජයේ විවිධ පැතිකඩ නිරූපණය කරනු ලැබේ. එලෙස නිරූපණය වනු ලබන එක් ක්ෂේත්‍රයක් පිළිබඳව කරුණු විමර්ශනය කිරීම මෙම අධ්‍යයනය තුළින් සිදුකරනු ලැබේ. ඒ අනුව අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුව වූයේ " දරු නැළවිලි ගීතවලින් නිරූපණය වන ස්ත්‍රී පුරුෂ සමාජ භාවය කුමක්ද?" යන්න පිළිබඳවයි. බොහෝ විට දරු නැළවිලි ගීත ගායනා කිරීම තුළ දරුවන් දුව,පුතා වශයෙන් වෙන් කිරීම මගින් කාන්තාවන් කෙරෙහි පවතින වෙනම ආකල්පයත් පුරුෂයන් කෙරෙහි පවතින වෙනම ආකල්පත් මෙම ගීත කලාව තුළ දැකිය හැකිය. මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුව විසඳා ගැනීම සඳහා අධ්‍යයන ප්‍රශ්න කිහිපයක් වෙත අවධානය යොමු කරන ලදී. විශේෂයෙන්,

1. දරු නැළවිලි ගීත යනු මොනවාද?
2. දරු නැළවිලි ගීත සඳහා පදනම් වී ඇත්තේ කුමක් ද?
3. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යනු කුමක්ද?
4. දරු නැළවිලි ගීතවලින් ස්ත්‍රී පුරුෂ සමාජ භාවය නිරූපණය වීමේ සමාජීය බලපෑම කෙබඳුද?

ආදී කරුණු හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේදී සිදු කරන ලදී.

## අධ්‍යයන අරමුණු හා වැදගත්කම

මෙම අධ්‍යයනය මගින් මුදුන් පමුණුවා ගැනීමට අපේක්ෂා කරන ලද අරමුණු කිහිපයකි. එනම්,

- දරු නැළවිලි ගීත කලාව හඳුනා ගැනීම
- දරු නැළවිලි ගීවලින් හෙළිවන ස්ත්‍රි පුරුෂ සමාජ භාවය පිළිබදව හඳුනා ගැනීම
- දරු නැළවිලි ගීතවල ඇතුලත් ජන සමාජ විඥාණය හඳුනා ගැනීම
- කාන්තාව හා පුරුෂයා කෙරෙහි දරු නැළවිලි ගී යොමුකර ඇති ආකල්ප හඳුනා ගැනීම
- ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳව දරු නැළවිලි ගී මගින් නිරූපිත තොරතුරු හඳුනා ගැනීමත්

මෙම අධ්‍යයනය මඟින් අපේක්ෂා කරන ලද අරමුණු වේ. එමෙන්ම මෙම අධ්‍යයනයේ වැදගත්කම වශයෙන් ජන සමාජයෙන් වියැකී යන දරු නැළවිලි ගීත ඒකරාශි කිරීමත් දරු නැළවිලි ගීතවලින් කාන්තාව හා පුරුෂයා දෙස බලා ඇති දෘෂ්ටිය හඳුනාගෙන ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳව එමගින් තොරතුරු අනාවරණය කරගැනීමට හැකිවීමත් මෙම අධ්‍යයනයේ වැදගත්කමක් වශයෙන් පෙන්වා දිය හැක.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය ඔස්සේ මෙන්ම පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය කිරීම මගින් සිදු කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යටතේ මෙම අධ්‍යයනය මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල

කොට්ඨාශයේ සූරිය ආර නම් ගම්මානය කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන ලදී. එහිදී වාචික ඉතිහාස පර්යේෂණ ක්‍රමවේදය යටතේ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කරමින් දත්ත සපයා ගැනීම සිදුකරන ලදී. ජන සමාජය තුළ ලිඛිත ඉතිහාසගත තොරතුරුවලට වඩා මිනිසුන් තුළ පවතින ගීත එකතු කිරීමට නම් මිනිසුන්ගේ ආකල්ප, සමාජ විශ්වාස ඇතුළත් හර පද්ධතීන් ආමන්ත්‍රණය කිරීම සිදුකළ යුතුය. එහිදී නැළවිලි ගී පිළිබඳව අවබෝධයක් ඇති ග්‍රාමීය මව්වරුන් සමග පවත්වනු ලැබූ සම්මුඛ සාකච්ඡා මඟින් එම ප්‍රදේශයේ භාවිතයට ගනු ලැබූ දරු නැළවිලි ගීත පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි වූ අතර එහිදී එම ගීත පටිගත කර ගැනීම සිදු කරන ලදී. ඒ ඔස්සේ ලබා ගනු ලැබූ දත්ත මූලික කරුණු ඔස්සේ වර්ග කරමින් එකී දත්ත ගුණාත්මකව විශ්ලේෂණය කරමින් ඒ ඔස්සේ නිගමනවලට එළැඹීම සිදු කරනු ලැබීය. ගුණාත්මක පයේෂණ ක්‍රමවේදය යටතේ මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

**සාහිත්‍යය විමර්ශනය**

ශ්‍රී ලංකාවේ ජන ගී, ජන කවි ආදී ග්‍රාමීය ජන ජීවිතය විසඳ කරවන ක්ෂේත්‍ර පිළිබඳව ග්‍රන්ථ රචනා වී ඇත. නමුත් සාහිත්‍ය තුළ දරුනැළවිලි ගී හා ඒවායේ අන්තර්ගතයන් පිළිබඳව වෙනම ලියවුණු ගැඹුරු අධ්‍යයනයන් මෙම අධ්‍යයනයේදී හඳුනා ගැනීමට නොහැකි විය. එසේ වුවද ග්‍රාමීය ජනතාවගේ සිතුම් පැතුම් හා ආකල්ප ප්‍රදර්ශනය වන සාහිත්‍ය නිර්මාණ ලෙස සැලකෙන ජන කවි, ජන ගීත හා ජන සංගීතයට අදාළ වෙනත් විවිධ ගායනා පිළිබඳව සිදු වී ඇති පර්යේෂණ මෙම අධ්‍යයනයේදී අපගේ අවධානයට ලක්විය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ජන කවි එකතුව පිළිබඳව අධ්‍යයනය කරනු ලැබූ ලේඛකයෙකු ලෙස මිනුවන් පී. තිලකරත්න මහතා හැඳින්විය හැකිය. ඔහු විසින් ලියන ලද ජන කවි සංග්‍රහය නමැති කෘතියේ බොහෝ ප්‍රදේශවල පවතින ජන කවි පිළිබඳව තොරතුරු දැක්වේ. එම ජන කවි අතර දරු නැළවිලි ගීත පිළිබඳව ද එක් කොටසක තොරතුරු අන්තර්ගත වේ. එහි පවතින පොදු ජන කවිවල ඇතැම් ජන කවි මෙම අධ්‍යයන ක්ෂේත්‍රයේදී හමුවූ අතර භාෂාමය වෙනස්වීම් හා ඇතැම් ජනකවිවල අර්ථයන්හි වෙනස් වීම් මෙම අධ්‍යයනය තුළ දක්නට ලැබිණි. මිනුවන් පී තිලකරත්නගේ ජන කවි සංග්‍රහය තුළ දක්නට ලැබෙන "දොයි දොයි දොයි දොයිය බබා- බයි බයි බයිය බබා"(තිලකරත්න, 2006) යන නැලවිලි ගීතය මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙනුයේ 'දොයි දොයි දොයිය බබා'ලෙස නොව 'දොයි දොයි දොයිය පුතා' වශයෙනි. නමුත් ජනකවි වර්ග කිරීමක් මෙම කෘතිය තුළ දක්නට නොලැබිණි. ජන කවි එකතුවක් පමණක් දක්නට ලැබෙන අතර ඒවා විවරණය කිරීමක් හෝ එම ගීත තුළින් හෙළිවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව හෝ තොරතුරු මෙම සාහිත්‍ය ග්‍රන්ථවලින් හමු නොවේ.

නෝමන් සිරිපාල නම් ලේඛකයා විසින් "අපේ ජනකවි මිහිර" යනුවෙන් (2016) වර්ෂයේ ලියන ලද කෘතිය ද පරිශීලනය කරන ලදී. එහි ජනකවි විශේෂ රාශියක් හා අනෙකුත් ජන විඥානයට අයත් කවි රාශියක් දක්නට ලැබුන ද දරුනැළවිලි ගී සඳහා ලබා දී ඇත්තේ ඉතා අඩු අවධානයකි.

ස.ජ. සුමනසේකර බණ්ඩා මහතා විසින් ලියන ලද "පහළ ඌවේ ජනකවි" නමැති කෘතිය ද මෙම අධ්‍යයනයේදී භාවිතයට ගනු ලැබූ අතර එමගින් ඌව පළාතේ ජන කවි පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි විය. එහි වැඩි අවධානයක් ලබා දී ඇත්තේ ජීවන ව්‍යවහාර හා බැඳුණු, රැකියා හා බැඳුණු ජනකවි කෙරෙහිය. පතල් කර්මාන්තය, යකඩ කර්මාන්තය ආදී බොහෝ කර්මාන්ත පිළිබඳ ව ජන කවි ඒ තුළ දක්නට ලැබිණි. නමුත් දරුනැළවිලි ගී පිළිබඳව ඌව පළාතේ විශේෂ අවධානයකට ලක් වූයේ ද යන්න සැක සහිතය. එනිසා මෙම ජනකවි සංග්‍රහයේ ද දරුනැළවිලි ගී පිළිබඳව අධ්‍යයනය කිරීම පහසු නොවීය.

දරු නැළවිලි ගීත පිළිබඳව මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සම්බන්ධව ද තොරතුරු අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයට අදාළව සිදු කරන ලදී. එහිදී කමලා ලියනගේ හා සුමුදු වළාකුළුගේ යන කතුවරුන් විසින් රචනා කරන ලද "ස්ත්‍රී පුරුෂ සමාජ භාවය හා ස්ත්‍රීවාදය" යන ග්‍රන්ථය පරිශීලනය කරන ලදී. එම ග්‍රන්ථයේ ජනකවි හෝ දරුනැළවිලි ගීත ආශ්‍රිතව තොරතුරු සඳහන් නොවුනද ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට අදාළ තොරතුරු නිරූපණය කර තිබිණි.

මෙම ලේඛකයන්ගේ පොදු නැම්යාව වන්නේ ජන කවි විශාල ප්‍රමාණයක් ඒකරාශී කිරීම වන අතර එම ජන කවිවලම කොටසක් ලෙස දරුනැළවිලි ගී දක්නට ලැබීමයි. එමෙන්ම මෙම අධ්‍යයනවල දක්නට ලැබෙන පර්යේෂණ හිඩැස වන්නේ මෙම ජන කවි සංග්‍රහයන්ගෙන් ලබාගන්නා තොරතුරු ස්ත්‍රී, පුරුෂ සමාජ භාවයට බලපානු ලබන්නේ කෙසේද යන්න ඒ තුළ විග්‍රහ නොවීමයි. එනිසා මෙම අධ්‍යයනය මඟින් සිදුවනුයේ දැනට සාහිත්‍ය මූලාශ්‍රවල පවතින හිඩැසක් වන දරු නැළවිලි ගීත සහ ස්ත්‍රී පුරුෂ සමාජ

භාවය අතර ඇති තොරතුරු විමර්ශනය කිරීමට උත්සාහ දැරීම ය.

**විමර්ශනය**

**දරු නැළවිලි ගීත**

දරුවා යනු සමාජයක් සතු වටිනාම සම්පතකි. දරුවාගේ ළමා කාලය ජීවිතයේ වඩා තීරණාත්මක අවධියක් වශයෙන් සලකනු ලැබේ. ළමාවියේදී දරුවන්ට ලැබෙන අත්දැකීම් ඔවුන්ගේ අවිඥානයේ තැන්පත් වී පසුකාලීනව දරුවාගේ පෞරුෂය හැඩ ගැසීම කෙරෙහි බලපානු ලබන බව සිග්මන් ෆ්‍රොයිඩ් විසින් ප්‍රකාශ කර තිබේ (අබේපාල,2022). ළදරු අවදියේ සිටම දරුවාගේ මානසික තත්ත්වය යහපත් කිරීම සඳහා ග්‍රාමීය මව්වරුන් විසින් දරු නැළවිලි ගීත භාවිත කර තිබේ. යහපත් පුරවැසියෙකු රටට දායාද කිරීමේ මූලාරම්භය සිදුවන්නේ දරුවකුගේ ළමා කාලය තුළිනි. එකී ළමා කාලය තුළ එන පූර්ව ළමාවිය දරුවෙකුගේ ජීවිතයේ වැදගත් කාල පරිච්ඡේදයක් වනු ලැබේ. මෙම අවධියේදී දරුවා තමාට ඇසෙන හා දකින දෙයින් වැඩි අත්දැකීම් ප්‍රමාණයක් ලබා ගැනීමට උත්සාහ දරයි.ඒ අනුව දරුවා තමාට ශ්‍රවණය වන දරු නැළවිලි ගීත තුළින්ද බොහෝ අත්දැකීම් ප්‍රමාණයක් ලබා ගැනීම නොරහසකි. එබැවින් දරුවාගේ මනස වෙත ධනාත්මක පණිවිඩය යැවීමට වගබලා ගැනීම මව්වරුන් ඇතුළු වැඩිහිටියන් සතු වගකීමකි. දරු නැළවිලි ගී යනු දරුවාගේ මනස සුවපත් කිරීමේ හැකියාවක් ඇති ආධ්‍යාත්මික හා භාවාත්මක හැඟීම් සමුදායකි. කුඩා දරුවන් හැඬීමේ දී ඔවුන් නලවා ගැනීම, සැනසීම සඳහා මෙන්ම දරුවා නිදිකරවා ගැනීම සඳහාත් අතීත ග්‍රාමීය ජන සමාජයේ දරුනැලවිලි ගීත භාවිත කරන ලදී. දරුවා හා මව අතර පවතින ශක්තිමත් බැඳීම, ආදරය දරු නැළවිලි ගී ඔස්සේ තව තවත් දරුවා වෙත සම්ප්‍රේෂණය කරවීමක් දරු නැළවිලි ගීත තුළින් සිදුකිරීමට හැකි විය. පවුල, සමාජය, ලෝකය කෙරෙහි දරුවා තුළ ඇතිවන සංවේදීත්වයේ මූලාරම්භය දරුනැළවිලි ගී ඔස්සේ දරුවාගේ මනසට කා වැද්දවීම සිදුවිය. දරු නැළවිලි ගීතවල සඳහන් වචනාර්ථය දරුවාට නොතේරුන නමුදු එම ගීතවල රිද්මය හා ශබ්දාර්ථය ඔස්සේ දරුවාට කිසියම් සැනසීමක් ලැබීමටත් හඬන දරුවකු නලවා ගැනීමටත් එකී දරු නැළවිලි ගීත ප්‍රබල මාධ්‍යයක් විය. මව විසින් ඉතා සෙනෙහසින් යුතුව කිසියම් රිද්මයකට අනුව ගායනා කරනු ලබන දරු නැළවිලි ගීත මගින් දරුවාගේ මනස සැහැල්ලු වීමක් සිදුවන අතර ඔහුගේ මනස යහපත් සිතුවිලිවලින් නිරන්තරයෙන් පෝෂණය වීම සිදුවිය. මව් සෙනෙහසේ සුවය වර්තමාන සමාජයේ උපදින දරුවාට සාපේක්ෂව අතීත ගැමි සමාජය දරුවාට රිසිසේ විඳ ගැනීමට අවස්ථාව ලැබිණි.සංකීර්ණ සමාජ රටාව හමුවේ මුදල පසුපස දිව යන අවිවේකී ජීවිත තුළ අතීතයේ මෙන් දරුවන්ට නැළවිලි ගී ගායනා කරමින් සැනසීමට මව්වරුන්ට විවේකීභාවයක් කාල වේලාවක් හිමි නොවීම අභාග්‍යසම්පන්න කරුණකි. ඔවුන් දුරකථනය හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික උපකරණ මගින් දරුවන් නැලවීම සඳහා විවිධ ගීත යොදා ගනු ලැබේ. නමුත් මව් තුරුලේ සැනසෙමින් මවගේ ආදරය මුසු වූ හඬ භාවිත කරමින් මව හා දරුවා අතර ඇස් යොමුව ඔස්සේ ඇතිවන අප්‍රකාශිත අදහස් හුවමාරු ඔස්සේ ඇතිවන ශක්තිමත් බැඳීමක් ඉහත සඳහන් කළ ඉලෙක්ට්‍රොනික උපකරණ භාවිත කරමින් සිදුවන නැළවිලි ගී ඔස්සේ දරුවාට හිමි නොවෙ.මෙම දරු නැළවිලි ගීත මගින් දරුවාගේ චින්තනයට ධනාත්මක බලපෑමක් ඇති කිරීමටත්, දරුවාගේ බුද්ධිය වර්ධනයටත්, දරුවා තුළ සංයමයක් ඇති කිරීමටත් ශක්තියක් පවතී. දරු නැලවිලි ගීත පිළිබඳව අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වන කරුණක් වන්නේ යුගයෙන් යුගය සමාජ අවශ්‍යතා අනුව දරු නැළවිලි ගීත නිර්මාණය කර තිබෙන බවයි.නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකාව විදේශ ආධිපත්‍යයට නතු වී තිබෙන වකවානුවක ටිබෙට් ජාතික එස් මහින්ද හිමි විසින් රචනා කරනු ලැබූ ජාතික තොටිල්ල හි එන දරු නැළවිලි ගීතවලින් ප්‍රකාශ වන්නේ රට දැය විදේශ ආධිපත්‍යයෙන් මුදවා ගැනීමට කුඩා කල සිටම දරුවාට ඇති වගකීම් පිළිබඳවයි. ඒ අනුව දේශාභිමානී හැඟීම් ඇතිවන ආකාරයෙන් නිරූපිත දරුනැළවිලි ගීතද දැකිය හැකි විය. සරල බස් වහරක් භාවිත කරමින් රචනා කර ඇති දරුනැළවිලි ගීත මගින් රට,ජාතිය, ආගම රැක ගැනීමේ දැඩි අවශ්‍යතාවය සහ වගකීම පිළිබඳවත් දරුවා රටට ණය නැති පුද්ගලයකු ලෙස මිය යන දිනක මිය යා යුතු බවත්, අතීත විරුවන්ගේ දක්ෂතා පිළිබඳවත් උකුලේ නැලවෙන දරුවාට අවබෝධ කර වීමට ගනු ලැබූ උත්සාහයකි (මහින්ද හිමි, 2017). දරුවෙකුගේ මනස කුඩා කල හිස් සුදු පැහැ පිටුවක් මෙනි. කුඩා අවදියේ ලබා ගනු ලබන භාෂාමය රූප රාමු හා අත්දැකීම් හමු වේ ක්‍රම ක්‍රමයෙන් එය සම්පූර්ණ වීමට පටන් ගනු ලැබේ. දරුනැළවිලි ගීත මගින් දරුවාගේ මනසට වීරත්වය පිළිබඳ හැඟීම් ,ආත්මාභිමානය පිළිබඳව හැඟීම් සහ දේශාභිමානී හැඟීම් ඇතුළත් කිරීම සඳහා කිසියම් උත්සාහයක් ගෙන ඇති බව පෙනේ. වර්තමාන සමාජයේ පවා මව්වරුන්ගේ මුව තුළ නිරායාසයෙන් ජාතික තොටිල්ල පද්‍ය පන්තියේ එන නැළවිලි ගීත මුමුණනු ලබන්නේ එතරම් සරල හා සුගම බස් වහරකින් යුතුව ළමා මනසට මෙන්ම


වැඩිහිටි මනසට ද ගෝචර වන ආකාරයෙන් ම එකී දරුනැළවිලි ගීත නිර්මාණය කර තිබෙන බැවිනි. බොහොමයක් දරුනැළවිලි ගීත මුඛපරම්පරාගතව හිමි වූ අස්පර්ශනීය උරුමයන් අතරට ගත හැකි සාහිත්‍යාංගයක් වශයෙන්ද පෙන්වා දිය හැකි වේ.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු පුද්ගලයෙකුගේ ජීව විද්‍යාත්මක ලිංගිකත්වයෙන් වෙනස් වූ, සමාජය විසින් ගොඩනගන ලද සංකල්පයකි. සරලව කිවහොත්, එය සමාජයක් තුළ පිරිමියෙකු හෝ ස්ත්‍රියක ලෙස පුද්ගලයෙකු හඳුනාගන්නා ආකාරය සහ එම සමාජය විසින් ඔවුන්ගෙන් අපේක්ෂා කරන චර්යා රටාවන්, භූමිකාවන්, වගකීම් සහ ලක්ෂණ සමූහයයි (Oakley, 1972).

මානව ප්‍රජාවගේ ලිංගිකභාවය වෙනස ස්ත්‍රී පුරුෂ වශයෙන් තීරණය වනු ලබන්නේ පුද්ගලයෙකුගේ උත්පත්තිය මගිනි. මෙය මිනිස් ප්‍රජාවට මෙන්ම සත්ව ලෝකය තුළද පවතින සදාතනික භාවයකි. මිනිසා තුළ පවතින මෙම ලිංගිකභාවයේ වෙනස අනුව ඔවුන්ගේ ශරීර ඉන්ද්‍රියන් වර්ධනය වීම සිදුවේ. මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන පදය රොබට් ස්ටොලර් විසින් (1968) වර්ෂයේ දී මනෝ විශ්ලේෂණය පිළිබඳ අධ්‍යයනයකදී මුලින්ම භාවිත කරනු ලැබූ අතර එහිදී ඔහු මෙම ස්ත්‍රී පුරුෂ සමාජ භේදයන් නොසලකා හරිමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන පදය භාවිතයට ගනු ලැබීය. නමුත් නූතන අර්ථයෙන් යුතුව පුළුල් වශයෙන් ස්ත්‍රීවාදීන් විසින් මෙම ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යන පදය භාවිත කොට තිබේ (ලියනගේ සහා වළාකුළුගේ, 2006). ජීව විද්‍යාත්මක ලිංගිකත්වය උපතින්ම ලැබෙන, ප්‍රජනක පද්ධතිය, වර්ණදේහ සහ හෝමෝන වැනි කායික ලක්ෂණ මත පදනම් වූ දෙයකි. නමුත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමාජය සහ සංස්කෘතිය විසින් නිර්මාණය කරන ලද දෙයකි. එය ඇඳුම් පැළඳුම්, රැකියා, කතා කරන ආකාරය, පවුල තුළ සහ සමාජය තුළ ඉටු කරන භූමිකාවන් වැනි විවිධ අංගයන්ගෙන් ප්‍රකාශ වේ (Butler, 1990). එනම්, ඇතැම් සංස්කෘතීන් තුළ නිවසේ වැඩ කටයුතු කාන්තාවන්ට ද, පිටත රැකියා පිරිමින්ට ද හිමි යැයි සැලකීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ භූමිකාවකි. ඒ අනුව අතීතයේ සිටම සමාජයේ විවිධ තත්ත්වයන් හිමිවූයේ ජීව විද්‍යාත්මක වශයෙන් ලැබී ඇති ස්ත්‍රී, පුරුෂ ලිංග භේදයේ වෙනස අනුවයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව භූමිකා බෙදීම සමාජය තුළ දැකිය හැකි වූ කරුණකි. භූමිකාවක් වශයෙන් හඳුන්වනු ලබන්නේ සමාජ කණ්ඩායමක් හෝ විශේෂයෙන් ම පිරිමි හෝ ගැහැනු සමග සම්බන්ධ වූ සංජානනීය හැසිරීම් හා සම්මතයන් සමූහයකි. ඒවා සමාජයක් එක් එක් ලිංගිකත්වයට සම්බන්ධ කරන ක්‍රියාකාරකම් වේ. මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව භූමිකා බෙදීම තාර්කික නොවේ. නමුත් අතීත ලාංකීය ග්‍රාමීය සමාජයේ පවා ස්ත්‍රීන් හා පුරුෂයන්ට පැවරී තිබුණේ වෙන වෙනම සමාජ භූමිකාවන්ය. ස්ත්‍රියකට ස්ත්‍රියක් වීම නිසාම අනන්‍ය වූ සමාජ භූමිකා දැකිය හැකි විය. නිදසුන් වශයෙන් ස්ත්‍රියකට පැවරෙන කාර්යයන් වශයෙන් දරුවන් බිහිකිරීම, ඉවුම් පිහුම් කටයුතු, දරුවන් පෝෂණය කිරීම හා වෙනත් ගෘහශ්‍රිත කටයුතු සිදු කිරීම පැවරී තිබිණි. ස්ත්‍රී පාර්ශ්වයට සාපේක්ෂව පුරුෂ පාර්ශවයට සමාජය මඟින් හිමි වූ භූමිකා වෙනස් විය. ඒ සඳහා නිදසුන් වශයෙන්; පිරිමි පුද්ගලයන් නිවෙසින් පිටව කටයුතු කිරීම, ආර්ථික කටයුතුවල නිරතවීම, වාහන පැදවීම වැනි කාර්යයන් හිමි වී තිබිණි (ලියනගේ හා වළකුළුගෙ, 2006). අතීත සමාජයේ ස්ත්‍රියක් වාහනයක් පැදවීම ඇයට ඉතා අකැප කටයුත්තක් වශයෙන් සලකනු ලැබීය. එවැනි කටයුතු සිදුකරන ස්ත්‍රීන් දෙස සමාජය පිළිකුල් දෘෂ්ටියක් හෙලන ලදී. ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ පවතින මෙම භූමිකා සමාජය විසින් ලබාදී තිබෙන තත්ත්වයකි. මෙම සමාජය විසින් ලබා දී තිබෙන තත්ත්ව කාලයෙන් කාලයට, සමාජයෙන් සමාජයට වෙනස්වන ආකාරයක් දැකිය හැකිය. ඇතැම් අවස්ථාවල දැකිය හැකි කරුණක් වන්නේ මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංකල්පය කාන්තාවන්ට හානිදායක තත්ත්වයක් ඇතිකර ඇති බවයි. යම්කිසි සමාජයක් කිසියම් කාලයක ස්ත්‍රියකට හෝ පුරුෂයාට ලබා දී ඇති තත්ත්ව/භූමිකා තවත් කාලයක තවත් සමාජයක හාත්පසින්ම වෙනස් වියහැකිය. ඒ අනුව පැහැදිලි වන්නේ ස්ත්‍රී පුරුෂ ලිංග භේදය ස්ථිර දෙයක් වුවද ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ස්ථිර දෙයක් නොවන බවත් එය වෙනස් වන සුළු බවත්ය. සාම්ප්‍රදායික ස්ත්‍රී හා පුරුෂ භූමිකා වර්තමාන සමාජය තුළ වෙනස් වෙමින් පැවතියද ඒවායේ මූලබීජයන් තවමත් සමාජයේ ශේෂ වී තිබේ. මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ ස්ත්‍රීන් හා පුරුෂයන් හැසිරෙන හා ක්‍රියා කරන ආකාරය පිළිබඳව සමාජයීය වශයෙන් ගොඩනගනු ලබන දෘෂ්ටිවාදයන් හා සම්මතයන් පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ ස්ත්‍රීන්ගේ හා පුරුෂයන්ගේ භූමිකා පිළිබඳ ව සාකච්ඡා කිරීමේදී පවතින විවාදාත්මක කරුණක් වන්නේ මෙම භූමිකාවන් ස්ත්‍රීන්ට හා පිරිමින්ට සමාන පදනමකින් පිහිටන්නේ ද යන්න පිළිබඳ ගැටලුකාරී තත්ත්වයන් පවතින බැවිනි. වර්තමාන සමාජය කෙතරම් දියුණු භාවයට පත්වී තිබුණද කාලයත් සමඟ සමාජීය ආකල්ප වැනි තත්ත්වයන් පවා පරිණාමය වී පැවතියද ස්ත්‍රී පුරුෂ

සමාජ භූමිකාවල වෙනසක් තවමත් අතැම් අංශ සම්බන්ධයෙන් වෙනස් වී නැති බව දැකිය හැකි වේ.




මූලය: ලියනගේ සහා වළාකුළුගේ, 2006

රූපය 1: සමාජය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සබඳතා නිර්මාණය නී ඇති ආකාරය

## දරු නැළවිලි ගී මගින් හෙළිවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය

දරු නැළවිලි ගීත සාහිත්‍යය පිළිබඳව විචාරාත්මකව අධ්‍යයනය කරන විට අධ්‍යයනය සඳහා යොදාගත් ප්‍රදේශයේ දරු නැළවිලි ගීතවලින් විවිධ තොරතුරු හඳුනා ගැනීමට හැකි විය. මෙහිදී විශේෂ අවධානයක් යොමු කරන ලද්දේ දරු නැළවිලි ගීවලින් හෙළිවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය කුමක්ද යන්න විමසා බැලීමයි. විශේෂයෙන්ම ස්ත්‍රීන් හා පුරුෂයන් ලෙස සමාජයේ ප්‍රධාන ප්‍රභේද දෙකකට මානවයන් බෙදන අතර කුඩා දරුවන්ගේ සිටම ගීත කලාව තුළ ද මෙම තත්ත්වය හඳුනා ගැනීමට හැකි විය. මෙම අධ්‍යයනයේදී ප්‍රධාන වශයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන අනුමාතෘකා තුනක් යටතේ විවරණය කිරීමට හැකි විය. එනම්,

1. දරුවන් දුව පුතා ලෙස වෙන් කිරීම
2. දරුවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත ඇතිවන බලාපොරොත්තු
3. ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට අදාළ වෙනත් තොරතුරු වශයෙනි.

## දරුවන් දුව, පුතා ලෙස වෙන් කිරීම

විශේෂයෙන්ම කුඩා දරුවන් පොදුවේ හැඳින්වීම සඳහා 'බබා' යන වචනය සිංහල සාහිත්‍යයේ බහුල වශයෙන් යොදාගෙන තිබේ.

'දොයි දොයි දොයිය බබෝ
බයි බයි බයිය බබෝ'

නමුත් මෙම 'බබා'යන පදය දීර්ඝ කාලීනව යොදා නොගනිමින් කුඩා කාලයේ සිටම දරුවන්ට දුව, පුතා වශයෙන් වටිනාකමක් නිර්මාණය කරනු ලැබීය. එකී වෙන් කිරීම තුළම පසුකාලීනව දරුවන් කෙරෙහි යොමු කරන ආකල්ප සමාජයේ වෙනසකට ලක් කරනු ලැබේ. 'දොයි දොයි දොයිය බබා' යන ගීතයම පසුකාලීනව 'දොයි දෙයි දොයිය පුතා','දොයි දොයි දොයිය දුවේ'යනුවෙන් වෙන්කර ගැනීම ග්‍රාමීය සමාජය තුළ දැකිය හැකිය.

''දොයි දොයි දොයි දොයිය පුතා
බයි බයි බයි බයිය පුතා
නාඩා නිදියන්න පුතා
බුදු සරණයි නුඹට පුතා''

''දෝයි අම්මා දෝයියෝ
බයි අම්මා බයි බයියෝ
බයි බයියන් බයිය දුවේ
දොයි දොයියන් දොයිය දුවේ
නාඩා නිදියන්න දුවේ
අම්මා නුඹේ ඒවි දුවේ''

මූලය: ඥානවතී, සම්මුඛ සාකච්ඡාව, 2023

ඉහත මුල්ම දරු නැළවිලි ගීතය පුතෙකුට ආමන්ත්‍රණය කිරීම සිදුකරන ආකාරයත් දෙවෙනි දරු නැළවිලි ගීතය දුවණියකට ආමන්ත්‍රණය කරන ආකාරයත් නිරූපණය වේ. නමුත් තවදුරටත් මෙම දරු නැළවිලි ගීත පිළිබඳ විමර්ශනය කිරීමේදී පැහැදිලි වූයේ ඇතැම් අවාර්වල දුව පුතා ලෙස වෙන්කොට ආමන්ත්‍රණය කිරීම දැකිය හැකි වුවත් පසුකාලීනව දුව,පුතා යන දෙදෙනාටම 'පුතා' යන පොදු නාමයෙන් ආමන්ත්‍රණය කිරීමත් දැකිය හැකි විය. ඒ තුළින්ද පැහැදිලි වූයේ දුවෙකුට සාපේක්ෂව පුතෙකුට සමාජයේ වැඩි පිළිගැනීමක් ග්‍රාමීය සමාජය තුළ පැවැති බවයි.

## දරුවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ඇතිවන බලාපොරොත්තු

ග්‍රාමීය සමාජවල දුවනියකට සාපේක්ෂව පුතෙකුගෙන් බලාපොරොත්තු වූ කාර්යභාරය සහ වගකීම වැඩිය. මෙහිදී පුරුෂයන් පවුලේ ආර්ථිකයට ශක්තියක් වීම ග්‍රාමීය ජන සමාජය තුළ දැකිය හැකි වූ කරුණක් විය. මෙය මවගේ උකුලේ නැළවෙන දරුවාට කුඩා කල සිටම මනසට ධාරණය කරවීමක් දරුනැළවිලි ගීත මගින් සිදුකර ඇති බව පැහැදිලි විය.කුඩා කල සිටම තම දරුවා තම පවුලේ ආර්ථිකයට ශක්තියක් වනු ඇතැයි යන අපේක්ෂාව මව්වරුන්ගේ මනස තුළ පැවැති බව නිරූපණය වන දරු නැළවිලි ගීයක් වශයෙන් පහත ගීතය පෙන්වා දිය හැකිය.

''මගේ පුතා හරි හපනා
දවසක කොළඹට යනවා
පනම් දෙකක් පඩි කනවා
එක පනමක් මට දෙනවා''

මූලය: සුනීතා, සම්මුඛ සාකච්ඡාව, 2023

ඉහත ගීතයේ සඳහන් වන 'පනම' නම් වූ මුදල් ඒකකය ලාංකීය සමාජය තුළ භාවිතයට ගනු ලැබුවේ මහනුවර යුගයේදී පමණ වේ. කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සමග ඇති වූ ශ්‍රම සංචලතාවයත් සමඟ වැටුපට වැඩ කරන ක්‍රමයක් බිහිවීම සිදුවිය. ඒත් සමග ස්ත්‍රීන්ට වඩා පුරුෂයන් මෙම රැකියාවල නිරත වීම දැකිය හැකි විය. ඒ අනුව තම දරුවා රැකියාවල නිරතවී ලබා ගන්නා ආදායමෙන් තම පවුල රැක බලා ගනීවි යන අනාගත අපේක්ෂාව මව්වරුන් තුළ පැවැති බව ඉහත ගීතය තුළින් පැහැදිලි වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත භූමිකා බෙදීම තාර්කික නොවුනත් ග්‍රාමීය සමාජවල එම ලක්ෂණය දැඩි ලෙස දැකිය හැකි විය. සාම්ප්‍රදායික සමාජය තුළ කාන්තාව සිය නිවෙසින් පිටතට ගොස් කටයුතු කිරීම පිළි නොගන්නා තත්ත්වයකට පත්ව තිබිණ.ස්ත්‍රිය දුර්වල තැනැත්තියක් බවත් එබැවින් පුරුෂ පාර්ශ්වයේ අතවරයට පහසුවෙන් ඇය ලක්විය හැකි බවත් ගැමි සමාජය විශ්වාස කරන ලදී. එබැවින් සිය නිවසින් පිටතට ගොස් නිවසේ ආර්ථික කටයුතුවල නියැලීම, ආහාර ද්‍රව්‍ය සැපයීම වැනි දේ සිදු කිරීම පිරිමි පාර්ශ්වයට භාර විය. ඒ පිළිබඳව කුඩා අවධියේ සිටම සිය දරුවාට ප්‍රකාශ කරන ආකාරය ඉහත දරුනැළවිලි ගීය තුළින් විද්‍යමාන වේ. කාන්තාවට හිමි වූයේ දරුවන් පෝෂණය, කිරීම නිවස අලංකරණය කිරීම වැනි කටයුතු ය. වර්තමාන සමාජයේ පවා ස්ත්‍රිය පිරිමි පාර්ශවයට සාපේක්ෂව ශක්තිමත්භාවයෙන් හා නිර්භීතකමින් අඩු බවත් ඇයට තරගකාරී සමාජ රටාව තුල කටයුතු කිරීම අසීරු බවත් පුරුෂයා පවුලේ උපයන්නා බැවින් ස්ත්‍රිය ඔහුගෙන් යැපිය යුතු බවටත්, පුරුෂයා ගනු ලබන තීන්දු තීරණවලට ඇය අවනත විය යුතු බවත් පිළිගනු ලැබේ.. උක්ත කරුණු අනුව මෙවැනි දරුනැළවිලි ගීතයකින් පුරුෂයන්ගෙන් බලාපොරොත්තු වන ග්‍රාමීය ජන සමාජයේ මව්වරුන්ගේ දෘෂ්ටීන් පිළිබඳව කරුණු කිහිපයක් නිරීක්ෂණය කළ හැකිය. එනම්,

1. පිරිමි දරුවන් බොහෝ කාර්යශූර බව හා පවුල තුළ පවතින අපේක්ෂාවන් අනාගතයේ මුදුන්පත් කර ගැනීමට හැකි වේ යන මතය.
2. ගම් අතහැර නගරබද ප්‍රදේශවලට ගොස් දියුණු විය හැකිය යන හැඟීම
3. දරුවා වෙනුවෙන් මම සිදු කරනු ලබන මෙහෙය උදෙසා අනාගතයේදී මවගේ සුරක්ෂිත භාවය ත් තම දරුවා විසින් ඇති කරනු ලැබේ යන අපේක්ෂාව.

ඒ අනුව ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සම්බන්ධ කරුණු ඉහත නැළවිලි ගීතය තුළින් විද්‍යමාන වන බව පැහැදිලිව හඳුනාගත හැකි වේ.

එමෙන්ම ස්ත්‍රී පාර්ශවයට සාපේක්ෂව ග්‍රාමීය සමාජයේ පිරිමි දරුවෙකුගෙන් වීරත්වය අපේක්ෂා කර ඇති බව පහත දරුනැළවිලි ගීතය තුළින් පැහැදිලි වේ.

''ඔන්න බබෝ ඇතින්නියා
ගල් අරඹේ සිටින්නියා
ගලින් ගලට පනින්නියා
බබුට බයේ දුවන්නියා''

මූලය: සුනීතා, සම්මුඛ සාකච්ඡාව, 2023

කෙතරම් අපූරුවට දරුවා තුළ වීරත්වය ඔප්නැංවෙන අයුරින් මෙම ගීත නිර්මාණය කර තිබේද යන්න පිළිබඳව දරු නැළවිලි ගීත පරිශීලනය කිරීමේ දී පැහැදිලි වේ. සද්ධන්ත ඇතින්නියක් උකුලේ නැලවෙන දරුවාට බියෙන් ගලින් ගලට පැන දිව යන බව මෙම ගීතයේ සරල අර්ථය යි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ පුරුෂ පාර්ශවය සතු වීරත්වය මෙම ගීතවලින් ඔප් නංවා තිබේ. ස්ප්‍රයිඩ මෑන්,සුපර් මෑන් වැනි කාටූන් චරිත වර්තමාන සමාජයේ දරුවන්ගේ ලෝකවල වීරයෝ වන විට ග්‍රාමීය සමාජවල මව්වරුන් දරුවා තුළම වීරත්වය ගොඩනැගීම සඳහා මෙම ගීතවලින් උත්සහ දරා ඇති බව පැහැදිලි වේ. එමෙන්ම පහත සඳහන් නැලවිලි ගීතය දරුවාගේ මනස තුළ එවැනි වීරත්වයක් ජනිත කරවීමට භාවිතයට ගනු ලැබූ නැලවිලි ගීතයකි.

''පුංචි පුතා මගේ අතේ
නිදියනවා රජෙක් වගේ
සිහින දකින දකින සැරේ
පුංචි දෙතොල් සිනා සැලේ''

මූලය: ඥානවතී, සම්මුඛ සාකච්ඡාව, 2023

රජෙකුගේ වීරත්වයට තම දරුවා සමාන කිරීමක් මෙමගින් දැකිය හැකිවේ.

''ලොවේ ළමයි නඩු කියති
ගුටි අනිමින් සිර කරති
කැට කැබලිති දඩ ගෙවති
මගේ පුතා එහෙම නැති''

මූලය: ලීලාවතී, සම්මුඛ සාකච්ඡාව, 2023

ග්‍රාමීය සමාජයේ මවගේ ඇසට යොමු වන දේ පිළිබඳව දරුනැළවිලි ගීතයකින් මව විසින් ප්‍රකාශ කරනු ලැබේ. මෙම වැරදි වැඩි වශයෙන් ස්ත්‍රී පාර්ශවයට සාපේක්ෂව සිදු කරනුයේ පිරිමි පාර්ශවය විසිනි. පිරිමි පාර්ශවයේ වැරදි චරිත ලක්ෂණවලින් තම දරුවා ආරක්ෂා කරගැනීමේ අපේක්ෂාව මව තුළ පවතින බව මින් පැහැදිලි වේ. මෙම දරුනැළවිලි ගීතය මගින්,

1.සමකාලීන සමාජයේ ග්‍රාමීය පරිසරය තුළ නඩු හබවලට පැටලෙන පිරිමින්ගේ චරිත පිළිබඳ තොරතුරු ගෙනහැර දැක්වීම
2.වැඩිහිටියෙකු වූ පසු තම දරුවා එවැනි වැරදිවලින් මුදවා ගැනීමට මවට ඇති අපේක්ෂාව
3.මෙම නැළවිලි ගී ගායනා කිරීමේදී අසාගෙන සිටින අයට මෙවැනි ක්‍රියා කාන්තාව විසින් ප්‍රතික්ෂේප කරන බව දැන්වීම

යන තොරතුරු හඳුනා හැකි විය. මෙවැනි දබර කර ගැනීම තුළ දඩ ගෙවන මට්ටමට පිරිමි සමාජය වැඩි වශයෙන් යොමුවේ. ඒ අනුව මෙම දරු නැළවිලි ගීත තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් තොරතුරු හඳුනාගත හැකිය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සාකච්ඡා කිරීමේදී වර්තමාන සමාජයට වඩා ග්‍රාමීය සමාජවල මව්වරුන් දුවනියකට සාපේක්ෂව පුතෙකුට සමීප භාවයක් ලෙන්ගතුභාවයක් දක්වනු ලැබේ. තම පරම්පරා නාමය ඉදිරියට ගෙන යෑමට පුතෙකු ඉපදීම ම පවුලටම වාසනාව උදාවීමක් ලෙස සලකනු ලැබූ මව්වරු මෙම අධ්‍යයනය සිදුකිරීමේ දී හමු වීම සිදු විය. එහිදී දුවෙකු වර්ණනා කරන ඇතැම් පද යොදා ගනිමින් පුතුන් වර්ණනා කරන දරුනැළවිලි ගී හඳුනා ගැනීමට හැකි විය.

''මගේ පුතා රුවට රුවයි
දැක දැක ඉන්නට පිරියයි
මට ඇති එක මැණික තමයි
මගේ පුතු එය දැක නැලවෙයි''

''මගේ පුතා රත්තරනින් කළා වැනි
මගේ පුතා රන් පුන්කළ සක්වැනි
මගේ පුතා රැ පොදාට පෝය වැනි
මගේ පුතා රන් දුනුකේ මලක් වැනි''

මූලය: සුලෝචනා, සම්මුඛ සාකච්ඡාව, 2023

**ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ දරු නැළවිලි ගීතවලින් හෙළිවන වෙනත් තොරතුරු**

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළව දරු නැළවිලි ගීතවලින් හෙළිවන වෙනත් තොරතුරු කිහිපයක්ද මෙහිදී හඳුනාගත හැකි විය.එලෙස හඳුනා ගත හැකි වූ තොරතුරු අතර මවකගේ භූමිකාවන්, කාන්තාවන්ගේ ආභරණ භාවිතය පිළිබඳව අවස්ථා, දියණියකගෙන් බලාපොරොත්තු වන වගකීම පිළිබඳව ආදී වූ තොරතුරු මෙම දරුනැළවිලි ගීතවලින් හඳුනාගත හැකිවිය.

**දරු නැළවිලි ගීතවලින් හෙළිවන මවගේ චරිතය**

සිංහල ජන නාටක, වෙස්සන්තර ජාතකය වැනි ජාතක කථාවල මවගේ චරිතය පරමාදර්ශී චරිතයක් බවට පත්කර තිබේ. පවුලේ දරුවන්ගේ වැඩිම ආදරය දිනා ගනු ලබන සමාජයේ වැඩිම ආදර්ශමත් චරිතය ලෙස හඳුන්වනු ලබනුයේ මවගේ චරිතයයි. මවගේ හැසිරීම් රටාව, දරුවන් කෙරෙහි දක්වන ලැදියාව වැනි සියල්ලෙහිම සාරය ජන කවිවලට ගොනුවී පවතී. දරුවන් නැලවීම සඳහා භාවිත කළ ද මවගේ චරිතය බොහෝ තැන්වල ගායනා කරනු ලබයි. දරුවන් වෙනුවෙන් පියා මෙන්ම මව ද දුක්කම් කටලු විඳිනු ලබයි. පියා රැකී රක්ෂාවල නිරතවන අතර තුර මව විසින්.හාර ද්‍රව්‍ය සපයා ගැනීමේ සිට බොහෝ කර්තව්‍යයන් සිදුකරනු ලැබේ. මවගේ මව විසින්, සහෝදරිය විසින් ඇතැම් අවස්ථාවල දරුවන් බලා ගැනීම සිදුකරනු ලැබේ. එවැනි අවස්ථාවල මව් ගුණ ගැන සිහිකරමින් ගායනා කරන ලැබූ ගීත වශයෙන් මෙම ගීත පෙන්වා දිය හැකිය.

''අතට වෙරළු ඇහිඳ ගෙනේ
ඉනට පලා නෙළාගෙනේ
බරටම දර කඩා ගෙනේ
එයි අම්මා විගසකිනේ''

''නුඹේ අම්මා කොතැන ගියා
කොහිල විලේ පතට ගියා
පත් උදුරන් එන්න ගියා
එන්න නැතුව පමා ගියා''

මූලය: සුලෝචනා, සම්මුඛ සාකච්ඡාව, 2023

එපමණක් නොව දරුවන් සම්බන්ධයෙන් මව්වරු තුළ තිබෙන අසීමිත ආදරය පෙන්නුම් කරනු ලබන පහත නැළවිලි ගීය තුළින්ද පැහැදිලිවන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය භූමිකා ගොඩනැගීමේදී ස්වභාවයෙන්ම ස්ත්‍රිය පිරිමි පාර්ශවයට සාපේක්ෂව දරුවන් සම්බන්ධයෙන් සංවේදී බවයි.

''ඇතින්නියක් ලත් දරු පෙම්බරේයා
ඇතිනි රැලේ හැමටම කිරි එරේයා
අනිත් අතට දුන් මුදුවන් පිරේයා
ඉතින් පුතුට මවගේ ආදරේයා''

මූලය: ඥානවතී, සම්මුඛ සාකච්ඡාව, 2023

මවගේ චරිතය, මවගේ ස්වභාවය මෙම දරු නැළවිලි ගීතවලින් විද්‍යමාන වන අතර මේවා මව්වරු විසින්තමන් පිළිබඳවම නිර්මාණය කර ගත් ගීතවලට වඩා මෙම ගීත පාරම්පරික උරුමයක් වශයෙන් ගත්විට අවුරුදු ගණනාවක් පැරැණි වේ. මෙම ගීතවල මුල් නිර්මාපකයන් සොයා ගැනීමට නොහැකි වුවත් මෙම ගීත කලාව බොහෝ විට මව්වරුන්ට ගරුත්වයක් උදෙසා ග්‍රාමීය සමාජයේ පැවැති ගීත රටාවක් වශයෙන් ද සැළකිය හැකිය. මෙම ගීත තුළ විශාල පරිමාණයේ රැකියා අවස්ථා පෙන්නුම් නොකළත් එදිනෙදා පවුල් පරිසරය තුළ

ගෘහණියකගේ කාර්ය මවක් වශයෙන් දරුවන් සිටින අවස්ථාවේ පවා නොපිරිහෙලා ඉටු කළ බව මැනවින් විසඳ කරවන නැළවිලි ගීත වශයෙන් හැඳින්විය හැකිය.

**ආභරණ භාවිතය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව හඳුනා ගැනීමේ දී පැහැදිලි වන කරුණක් වනුයේ කාන්තාවන් ආභරණ භාවිතයට පිරිමින්ට සාපේක්ෂව ප්‍රියතාවයක් දක්වනු ලබන බවයි.

''දෑතේ වළලුත් නැතිකෝ
දෙපයේ ගිගිරිත් නැතිකො
අප්පා එයි දැන් හතිකෝ
නාඩන් සුරතල් මැණිකෝ''

මූලය: සෝමාවතී, සම්මුඛ සාකච්ඡාව, 2023

එම නැළවිලි ගීතයම වෙනත් ආකාරයකින් මෙලෙස ගායනා කරන බවට ද තොරතුරු අනාවරණය විය.

''අතට වළලු කොහෙන් දුවේ
පයට ගිගිරි කොහෙන් දුවේ
ඉනට හවඩි කොහෙන් දුවේ
දැනට නිදා ගනින් දුවේ''

මූලය: සුභානි, සම්මුඛ සාකච්ඡාව, 2023

දුවනියක් අලංකාර කිරීම සඳහා වළලු, ගිගිරි වැනි දේ භාවිත කරනු ලැබූ බව මෙම නැළවිලි ගීත තුළින් පැහැදිලි වේ.ග්‍රාමීය සමාජ ජීවිතයේ දරිද්‍රතාවය හමුවේ දියණියට එකී ආභරණ ලබාදීමට හැකියාවක් නොලැබී ඇති බව පෙනේ.

**දියණියකගෙන් බලාපොරොත්තු වන වගකීම පිළිබඳව**

ග්‍රාමීය ජන සමාජය තුළ පිරිමි දරුවෙකුට සාපේක්ෂව ගැහැණු දරුවෙකුගෙ ආරක්ෂාව සම්බන්ධයෙන් වැඩිහිටියන් සැලකිලිමත් වූ බව පෙනෙයි. දියණියකගේ චරිතවත්භාවය, බඹසර රැකීම ග්‍රාමය සමාජය තුළ බලාපොරොත්තු වූ බව දැකිය හැක.

''පතිවත සුරකින ළඳකගේ මූණේ..
පුන් සඳ සේ දිදුලන හඳ පානේ..
පන්දම මෙන් උසුලන රැ පානේ..
බඹලන බව දනු මගෙ සුදු නෝනේ''

''සිරි සැප වී නැලවෙන දෑලේ
මගේ දුව කිසි දුසිරිතකට නෑලේ
මුනි රජු දෙසූ දහමට කර ආලේ
පණ වගේ රකු දුව බඹසර සීලේ''

මූලය: හීන්බණ්ඩා, සම්මුඛ සාකච්ඡාව, 2023

ඉහත නැළවිලි ගීතය තුළ 'පණ වගේ රකුදුව බඹසර සීලේ' යන පදය තුළින් අවධාරණය කර ඇත්තේ තමන්ගේ ප්‍රාණය හා සමව කුමරි බඹසර රැකීම දියණියක් විසින් සිදු කළ යුතු බවය. පුරුෂ පාර්ශවයට සාපේක්ෂව ස්ත්‍රියකට නිදහස සීමිතය.ස්ත්‍රියකගේ ලිංගිකත්වය පහසුවෙන් පුරුෂයන්ට අතවරනයට ලක් කළ හැකි බැවින් එය ආරක්ෂා කළ යුතුය යන මතයක් සමාජය මුල් බැසගෙන පැවැතිණි.නමුත් පිරිමි පාර්ශවයට ඒවැනි නිති රීති හිමි නොවීය.එමගින්ද ස්ත්‍රී පුරුෂ සමාජ භාවය තුළ ස්ත්‍රියට හිමි වූ තත්වය පිළිබඳව පැහැදිලිව අවබෝධයක් ලබාගත හැකි වේ.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගම්මානවල දරු නැළවිලි ගීතවලින් හෙළිවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව කරුණු විමර්ශනය කිරීම මෙම අධ්‍යයනය මඟින් සිදුකරන ලදී. අධ්‍යයන ප්‍රදේශය වූ මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සූරිය ආර ගම්මානය තුළ ජීවත් වන මව්වරුන්ගෙන් සහ වැඩිහිටි පුද්ගලයන්ගෙන් ලබා ගනු ලැබූ දත්ත ඇසුරු කරගනිමින් සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනය තුළින් දරු නැළවිලි ගීතවල ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ තොරතුරු ගැබ් වී පවතින බව හඳුනාගත හැකි විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ දරුනැළවිලි ගීවලින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනා ගන්නේ කෙසේද? යන සරල පැනයට පිළිතුරු ලබාදීමට මෙහිලා උත්සාහ ගන්නා ලදී. මෙම දරු නැළවිලි ගීවලින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව කරුණු ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ හඳුනා ගැනීමට හැකි විය. එනම් දරු නැළවිලි ගීතවල දරුවන් දුව පුතා ලෙස වෙන් කිරීම, දරුවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ඇතිවන බලාපොරොත්තු, දරුවන්ට ලබාදෙන ඉලක්කවලට ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ බලපෑම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ වෙනත් තොරතුරු හඳුනා ගැනීමට හැකි විය. සමානාත්මතාවය යන සංකල්පය සෑම සමාජයකම පාහේ අගය කරනු ලැබූ සංකල්පයක් වුවද එය ක්‍රියාත්මක වීමේ දී නියමාකාරයෙන් ක්‍රියාත්මක වන්නේ ද යන්න පවතිනුයේ ගැටලුකාරී තත්ත්වයකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත භූමිකා සංවර්ධනය වීමේදී ස්ත්‍රී පාර්ශ්වයට වෙනමත් පුරුෂ පාර්ශවයට වෙනමත් භූමිකා පැවතීම දැකිය හැකිය. රැකියා ක්ෂේත්‍රයන්හි මෙම තත්ත්වය බහුලව දැකිය හැකි කරුණකි. නමුත් වර්තමාන සමාජ රටාවේ වෙනස්වීම හමුවේ පිරිමින් හා ස්ත්‍රීන් සම තැන්හි ලා සලකනු ලැබුවද චක්‍රාකාරව ස්ත්‍රිය පුරුෂයා යටතේ ජීවත් වීම දැකිය හැකි කරුණකි. භාරතීය සමාජයේ සිටම සියවස් ගණනාවක් පුරාවට ස්ත්‍රියට හා පුරුෂයාට වෙනස් සමාජ භූමිකා හා සමාජ තත්වයන් නිර්මාණය කරදී තිබේ. ස්ත්‍රිය අප්‍රධාන තත්ත්වයකට පත් කිරීමත් පුරුෂයා උසස් කොට සැලකීමත් පැරැණි භාරතීය

සමාජය තුළ දැකිය හැකි විය. ස්වාමියා මිය ගිය පසු ස්වාමියා දැවෙන සෑයට පැන ඇගේ දිවි තොරකර ගැනීමත් නැතිනම් පවුලේ වැඩිහිටි පිරිමි දරුවා යටතේ ජීවිතය ගෙවීමටත් ස්ත්‍රියට එකල සිදුවිය. ඒ අනුව පැහැදිලි වන කරුණක් වනුයේ අතීතයේ සිටම ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ භූමිකා ගොඩනැගීමේදී එක් පාර්ශවයක් තවත් පාර්ශවයක පීඩාවකට ලක් වීමට සිදුවී ඇති බවයි. එබැවින් එලෙස පීඩාවට පත්වෙන පාර්ශවය දුර්වල ශක්තිමත්භාවයෙන් තොර වූ පිරිසක් බැවින් ඔවුන් සෑම විටමන අනෙක් පාර්ශ්වය යටතේ ජීවත්වීම සිදුකළ යුතු විය. ලාංකීය සමාජය තුළ ද බොහෝ අවස්ථාවන්වල මෙම තත්ත්වය දැකිය හැකිවන අතර මෙම අධ්‍යයනය තුළින් ද විමසා බලනු ලැබුවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය දරු නැලවිලි ගීතවලින් ඉස්මතු කර ඇති ආකාරය පිළිබඳවයි. ඒ අනුව තෝරාගත් ප්‍රදේශයේ පවතින දරු නැළවිලි ගීත තුළින් ද ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ වන තොරතුරු හඳුනා ගැනීමට හැකිවූ බව සඳහන් කළ හැකිය. එමෙන්ම මෙම අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ දරු නැළවිලි ගීත එම ප්‍රදේශයට පමණක් ආවේනික වූ ගීත නොවන අතර මුඛ පරම්පරානුගතව ආ නැළවිලි ගීත වෙනත් ප්‍රදේශවල ඒ ආකාරයෙන්ම හෝ සුලු වෙනසක් සහිතව ගායනා කරනු ලබන බව ද හඳුනා ගැනීමට හැකි විය. ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව සතුව පවතින මුඛ පරම්පරානුගතව පැවත ආ දරු නැළවිලි ගීත මගින් හෙළි කරනු ලබන ස්ත්‍රී පුරුෂය සමාජ භාවීය පැතිකඩ පිළිබඳව අදහස් හඳුනා ගැනීම සඳහා මෙම අධ්‍යයනය ඉවහල් විය.

### ආශ්‍රිත ග්‍රන්ථ


අබේපාල, රෝලන්ඩ්, (2022), සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදය, කොට්ටාවඃ සාර ප්‍රකාශන

කෞශල්‍යා, දිලිනි, (2017), 19වන සියවසේ ඌව වෙල්ලස්ස ජනතාවගේ පරිසරානුබද්ධ ජන ජීවිතය පාරම්පරික ජන කවියෙන් පිළිබිඹුවන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්. (මොනරාගල දිස්ත්‍රික්කයේ තල්කොට ගම්මානය ඇසුරින්), ජනශ්‍රැති පිළිබඳ දෙවන පර්යේෂණ සමුළුව, නුගේගොඩ, කලා පර්ෂදය සහ සංස්කෘතික මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

ලියනගේ, කමලා සහා වලාකුළුගේ, සුමුදු, (2006), ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ස්ත්‍රී වාදය, කොළඹඃ ෆෙඩ්‍රික් ඊබට් පදනම.

ගුණවර්ධන, ප්‍රිශාන්ත,(2004), පුරාණ ගමඃ මානවවංශ පුරාවිද්‍යා විමර්ශනයක්, ජා ඇල; සමන්තී පොත් ප්‍රකාශකයෝ.

බණ්ඩාර, තිලකසිරි (1998), ඌව දනව්ව, ඌව පළාත් සංස්කෘතික අමාත්‍යංශය.

බණ්ඩාර, තිලකසිරි (සංස්),(1991), ඌව වංශ කතාව, ඌව පළාත් සංස්කෘතික අමාත්‍යංශය.

මහින්ද ,එස්.(2001),ජාතිය රන් විමනක් වේ,කොළඹඃ දයාවංශ ජයකොඩි සහා සමාගම.

මහින්ද ,එස්. (2017), දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල,කොළඹ ඃසදීපා ප්‍රකාශකයෝ .

Butler, Judith. (1990), Gender trouble: Feminism and the subversion of identity, New York: Routledge.

Oakley, Ann. (1972), Sex, gender and society, London: Temple Smith.

*සම්මුඛ සාකච්ඡා*

ඩබ්.ඒ. ඥාණවතී, අවුරුදු (65), සම්මුඛ සාකච්ඡා, සූරිය ආර, තණමල්විල. (2023.05.20)

සුනීතා, අවුරුදු (50), සම්මුඛ සාකච්ඡා, සූරිය ආර, තණමල්විල. (2023.05.20)

ලීලාවතී, අවුරුදු (50), සම්මුඛ සාකච්ඡා, සූරිය ආර, තණමල්විල. (2023.05.22)

සුභානි අතුකෝරල, අවුරුදු (48), සම්මුඛ සාකච්ඡා, සූරිය ආර, තණමල්විල. (2023.05.22)

සුලෝචනා මදුෂානි, අවුරුදු (25), සම්මුඛ සාකච්ඡා, සූරිය ආර, තණමල්විල (2023.05.22)

හීන් බණ්ඩා මයා, අවුරුදු (72), සම්මුඛ සාකච්ඡා, සූරිය ආර, තණමල්විල (2023.05.24)

සෝමාවතී, අවුරුදු (56), සම්මුඛ සාකච්ඡා, සූරිය ආර, තණමල්විල. (2023.05.24)